
(C) Sumitha Publishers

එක් පළාතක ලොකු ගෙයක් තිබුණා.
මේ ගෙයි මීයෝ රංචුවක් ද හිටියා.
මේ මීයෝ රෑට මී ගුලෙන් එළියට එනවා.
කෑම කාමරයේ විසිරී තියෙන කෑම කනවා.
බොහෝම සතුටින් කෑම කෑවත්
මීයන්ට බයකුත් තිබුණා.

මේ ගෙයි ලොකු බළලෙක් සිටියා.
මේ බළලා සද්ද නැතිව ඇවිත්
මීයන්ගේ ඇඟට පනිනවා.
එකෙකු අල්ලාගෙන දුවනවා.
බළලා කවුරුන් අල්ලාගනියි ද
දන්නේ නෑනේ.



(C) Sumitha Publishers

මීයන්ගේ බය ඒකයි.